# උරුම කළමනාකරණය මගින් පාහියන්ගල පුරාවිද්‍යා ස්ථානය සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස දියුණු කිරීම

පූජ්‍ය පාහියන්ගල සුමංගල හිමි*

**සංක්ෂේපය**

යම් කිසි සමාජයක් සතු පුරාණ ස්මාරක හා ගොඩනැගිලි ඇතුළු චංචල හා නිශ්චල සංස්කෘතික දේපළ ඒ සමාජයේ පුරාවිද්‍යා උරුම වේ. එම උරුමයන් හැකිතාක් දුරට ආරක්ෂා කරමින් සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස දියුණු කිරීම වැදගත් වේ. පාහියංගල පුරාවිද්‍යා ස්ථානය දකුණු ආසියාවේ පැරණිතම මානව ජනාවාසය ලෙස සලකන අතර ශ්‍රී ලංකාවේ ස්වභාවික විශාලතම ගල්ලෙන වේ. ස්ථානයේ පිහිටීම සහ ඓතිහාසික පසුබිම මූලික කරගනිමින් පාහියන්ගල උරුම භූමියට දෙස් විදෙස් සංචාරක ඇස නිරතුරු යොමු වන්නට විය. උරුම ස්ථානයක් ලෙස හඳුනාගෙන ඇති පාහියන්ගල පුරාවිද්‍ය ස්ථානය, සංචාරක පුරවරයක් ලෙස එහි වර්තමාන පසුබිම, සංවර්ධනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සහ ඒ සඳහා විධිමත් යෝජනා ද මෙහිදි සාකච්ඡාවට බඳුන් වේ. ස්ථානය ලෝක උරුම භූමියක් ලෙස සංවර්ධනය කිරීම සහ ඊට අවශ්‍ය උරුම කළමනාකරණ සැලැස්මක් ඉදිරිපත් කිරීම මෙහි මූලික අපේක්ෂාව වේ. මෙහිදී ප්‍රධාන වශයෙන් දත්ත රැස්කිරීම සිදුකරනු ලබන අතර ප්‍රධාන ආකාර දෙකක් යටතේ එය සිදුකරනු ලබයි. එනම් ප්‍රාථමික දත්ත රැස්කිරීම සහ ද්විතීයික දත්ත රැස් කිරීම යන ක්‍රම වේද දෙකයි. පර්යේෂණයන් හෝ අධ්‍යයනයන්හිදී ඊට අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා ගන්නේ දත්ත රැස් කිරීමෙනි. ප්‍රාථමික දත්තයන් රැස් කර ගැනීමේදී ක්ෂේත්‍ර අධ්‍යයන, සටහන් තබා ගැනීම හා සම්මුඛ සාකච්ඡාදිය යොදා ගැනීමට අදහස් කරමි. අධ්‍යයනයට අවශ්‍ය මූලික දැනුම ලබා ගැනීමේ දී ක්ෂේත්‍ර ගවේෂණය ඉතා වැදගත් වේ. ක්ෂේත්‍ර ගවේෂණයේ දී අදාළ පුරාවිද්‍යා ස්ථාන, අවට පාරිසරික කලාපය හා සමාජ සංස්කෘතීන් පිළිබඳවද අධ්‍යයනයක නිරත වන්නට විය.

## පාහියන්ගල සංචාරක භූමියට පැමිණෙන සංචාරකයින් හඳුනා ගැනීම

පාහියන්ගල පුරාවිද්‍යා සංචාරක ස්ථානය උරුම කළමනාකරණයේ දි සම්බන්ධ ප්‍රධාන සාධකය වන්නේ පුරාවිද්‍යාත්මක වැදගත්කමයි. උරුමය හා සංචරණය අතර ඇත්තේ දැඩි සම්බන්ධතාවයකි. එබැවින් උරුමයන් නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන් ගෙන්වා ගැනීමත්, ඔවුනට අවශ්‍ය තොරතුරු අධ්‍යයනය සහ ආස්වාදය ලබා දීමත්, ඔවුනට පහසුකම් සැලසීමත් උරුම කළමනාකරුවන්ගේ වගකීමකි. උරුම ස්ථානය නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට එම ස්ථානය කෙරෙහි දක්වන ආශාව, කැමැත්ත සහ අවශ්‍යතාවය දැඩිකිරීමට නොඑසේනම් පැමිණෙන සංචාරකයා යාන්තමින් නොයැමට අවශ්‍ය වාතාවරණය උපක්‍රමශීලීව සකස් කිරීමට උරුම කළමනාකරුවන් අවබෝධ කරගත යුතුය. පැමිණෙන

* *තාවකාලික කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය,* *sumangala909@yahoo.com*

සංචාරකයාට උරුම ස්ථානය පිළිබඳව ඓතිහාසික වටිනාකම වටහා ගැනීමත්, ඒ පිළිබඳව හදගැස්මක් ඇති කරවන්නට උරුම කළමනාකරුවන් ක්‍රියාකළ යුතුය.

පාහියන්ගලට පැමිණෙන සංචාරකයන් කිසියම් එක් වර්ගයකට හෝ අයත්ය. ඔවුන්ට විවිධ රුචි අරුචිකම් තිබිය හැකිය. ඇතැම්හු ජාත්‍යාලයෙන් පැමිණෙති. අතැම්හු වන්දනාකරුවෝ වෙති. අයෙක් කුතුහලය නිසාත්, තමන්ගේ නැරඹුම් ලේඛනයට තවත් අංගයක් එකතු කරගැනීමටත් පැමිණේ. ඇතැම් සංචාරකයන් පැමිණෙන්නේ තමන් ජීවත්වන පරිසරයෙන් හෙම්බත් වී ඒකාකාරී බවෙන් මිදීමට, එළිමහනකට ගොස් දර්ශන පථය වෙනස්කර ගැනීමේ අරමුණෙන් ය. සමහරෙක් ආස්වාදයෙන් තොරව කාලය ගෙවා දැමීමේ උපක්‍රමයක් ලෙසටද උරුම ස්ථානයට පැමිණේ. ඇතැම් සංචාරකයන් අධ්‍යයන කටයුතු සඳහා ද පැමිණේ. (පතිරණ යූ. පී. එස්, 2010)

පාහියන්ගල නැරඹීමට පැමිණෙන්නේ එහි ඇති පෞරාණිකත්වය, සෞන්දර්යය බව සහ රටක අනන්‍යතාවය පිළිඹිබු කෙරෙන ශේෂ වූ ලක්ෂණ සියැසින් දැක ගැනීම සඳහාය. මෙවැනිම උරුමයන් නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන් සඳහා දැක්මක් සහ සැලැසමක් ඇතිව උරුමය අර්ථ ගැන්වීම් කළ යුතුය. මෙම සැලැස්ම සකස් කිරීමේ දි නරඹන්නා වස්තු මූලික විය යුතුය. ඔහුවටා සැලැස්මක් සකස්විය යුතුය. හැමවිටම උරුමය නරඹන්නේ සංචාරකයන් ය. එය පවතින්නේ ද සංචාරකයන්ගේ අවශ්‍යතාවය මතයි. එය රැකිය යුතු වන්නේ ද සංචාරකයින් ය. උරුමය ආරක්ෂා කොට අනාගතයට ඉදිරිපත් කරන්නේ සංචාරකයන්ගේ පැමිණීම හේතුවෙනි. නොඑසේනම් මේ උරුමයන් ආරක්ෂා වීමට හෝ නඩත්තු වීම හෝ සංරක්ෂණය වීම සිදුනොවේ. පාහියන්ගල සංචාරක උරුම ස්ථානයට පැමිණෙන සංචාරකයින් ප්‍රධාන වශයෙන් කොටස් 2 කි. එනම්

01. දේශීය සංචාරකයන්
02. විදේශීය සංචාරකයන්

- ශාස්ත්‍රීය සංචාරකයෝ
- පාසල් ශිෂ්‍යයන්
- සාමාන්‍ය නරඹන්නන්
- ආස්වාදයෙන් තොර සංචාරකයෝ
- පාරිසරික සංචාරකයෝ

මෙම ප්‍රධාන සංචාරකයින්ගේ භූමිකාව නියෝජනය කරන විවිධ සංචාරක අනුකණ්ඩායම් ඉහත සැලසුමින් විස්තර වේ. දේශීය සංචාරකයන් හා විදේශීය සංචාරකයන් අතර ශාස්ත්‍රීය, පාසල් ශිෂ්‍යයන් සිටින්නට පුළුවන. විවිධ රුචි අරුචිකම් ඇති සංචාරකයන් උරුම කළමනාකරුවන් විසින් හඳුනාගත යුතුය. ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබාදිය යුතුය. ශාස්ත්‍රීය සංචාරකයෙක් නම් ඔහුට අවශ්‍ය ස්ථානයේ ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, ආගමික, සාමාජික සහ පාරිසරික ආදි තොරතුරු ලබාදීමට උරුම කළමානාකරුවන් උත්සාහගත යුතුය. මොවුන් නරඹන ස්ථානය පිළිබඳව ඡායාරූප ගනිමින්, සැලසුම් අදිමින්, සටහන් තබාගනිමින් බුද්ධියට යමක් එකතු කරගැනීමේ උත්සාහයක නිරතවීමක් දක්නට ලැබේ. පාසල් ශිෂ්‍යයන් සංචාරය කරනු ලබන්නේ හුදෙක් රටක පෞරාණික උරුමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහාය. සාමාන්‍ය නරඹන්නන් උරුම භූමියේ තමන්ට අවශ්‍ය ස්ථාන නරඹමින් කෙළිදොලෙන් සංචාරය කරයි. ඔවුන් උරුම ස්ථානය පිළිබඳ විශාල අවබෝධයක් ලබා

ගැනීමට උත්සාහ නොකරයි. ආස්වාදයෙන් තොර සංචාරකයන් උරුම ස්ථානය පිළිබඳව තැකීමක් නොකරන අතර ස්ථානය නැරඹීමෙන් ඔවුන් ආස්වාදයක් නොලබයි. පාරිසරික සංචාරකයන් ස්ථානයේ ජෛව විවිධත්වය, ස්වභාව සෞන්දර්ය මූලික කරගනිමින් සංචාරය කරයි. උරුම කළමනාකරුවන් විසින් ඔවුනට අවශ්‍ය පරිසරය සකසා දීමට ක්‍රියාකළ යුතුය. මේ අනුව පාහියන්ගල සංචාරක භූමියට ඉහත සඳහන් කළ විවිධ රුචි අරුචිකම් ඇති සංචාරකයන් පැමිණෙන බැවින් ඔවුන්ව හඳුනාගෙන උරුම කළමානාකරුවන් ඒ අනුව ක්‍රියාකළ යුතුය.



**ඡායාරූප අංක 01. සාමාන්‍ය නරඹන්නන් ආගමික කටයුතුවල නියැලෙන ආකාරය**

## පාහියන්ගල උරුම භූමියේ සංචාරක කළමනාකරණ සැලැස්ම හා සංචාරක පහසුකම්

පාහියන්ගල උරුම ස්ථානය නරඹන්නට පැමිණෙන සංචාරකයන් සඳහා සංචාරක පහසුකම් සැලසීම උරුම කළමනාකරුවන්ගේ වගකීමකි. මෙහිදි සංචාරකයින් හඳුනාගෙන ඔවුන්ගේ අවශ්‍යතාවයන් තේරුම්ගෙන ඒ අනුව ක්‍රියා කිරීමට උරුම කළමනාකරුවන්ට සිදුවේ. උරුම ස්ථානයක් නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රතිශතය වැඩිකර ගැනීමේ එක් උපක්‍රමයක් ලෙස සංචාරක පහසුකම් නිසිලෙස සපයාදීම පෙන්වා දිය හැකිය.

උරුම ස්ථානය නරඹන්නන් සඳහා සේවා පහසුකම් සැපයීමේ දි කළමනාකරණ සැලසුම් අත්‍යවශ්‍ය වේ. එහි සඳහන් වන ආකාරයට කළමනාකරණ සැලසුම නරඹන්නන් සඳහා සැපයෙන සේවාවන් සහ අරමුණු එහි සඳහන් විය යුතුය. මෙහිදි ප්‍රාදේශීය පරිපාලනය සහ සංචාරක සංවිධාන සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ ඒ අනුව සැලසුම් සකස් කිරීම සුදුසු බව පෙන්වා දී ඇත. මෙවැනි සැලසුමකදි උරුම ස්ථානය නඩත්තු කිරීම පිළිබඳව ප්‍රතිපත්ති සහ ගතහැකි ක්‍රියාමාර්ග, ඇතුළත් වීමේ ගාස්තු සහ එයින් යැපෙන ආදායම සහ එය යෙදවිය යුතු ආකාරය, උරුමයට සිදුවිය හැකි සේවාවන් සහ ඒවා හඳුනාගැනීම වර්ගීකරණය සහ ඒ අනුව සැලසුම් සකස් කිරීම ආදි කරුණු අන්තර්ගත විය යුතුය.

පාහියන්ගල සංචාරක ස්ථානය තුළ සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීමේ දි සංචාරකයින්ගේ අවශ්‍යතා තේරුම්ගැනීම වැදගත් වේ. මෙය ඉතා අපහසු කටයුත්තකි. මන්දයත් එකිනෙකට වෙනස් අවශ්‍යතා සංචාරකයින්ට ඇති බැවිනි. එහෙත් මෙය පෞද්ගලිකව එකිනෙකාගේ අවශ්‍යතා ඉටු කිරීමක් ලෙස අර්ථ ගැන්වෙන්නක් නොවේ.

පොදුවේ පැමිණෙන නරඹන්නන්ගේ අවශ්‍යතා තේරුම් ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටියක් අනුගමණය කිරීම මෙයින් අදහස් වේ. පාහියංගල සංචාරක ස්ථානය තුළට සංචාරක ආකර්ෂණය ඇතිකරවීම සඳහා වැදගත් කාරණා කිහිපයක් මෙහිදි සාකච්ඡා කළ හැකිය.

### සංචාරකයන් පිළිගැනීම

සංචාරකයන් සුහදශීලි මිත්‍රත්වයකින් පිළිගත යුතුය. ප්‍රවේශපත් ලබාගන්නා ස්ථානය සංචාරක උරුම ස්ථානය හා සම්බන්ධ වන ප්‍රථම අවස්ථාවයි. මෙහිදි සංචාරකයාට උණුසුම් පිළිගැනීමකින් ප්‍රතිචාර දක්වීමෙන් ඔහුට ස්ථානය පිළිබඳව හොඳ ආකල්පයක් ඇතිවේ. පාහියන්ගල සංචාරක ස්ථානය තුළ මෙවැනි පිළිගැනීමක් වර්තමානයේ දක්නට නොලැබේ. මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ගවලට අදාළ බලධාරින් පෙළඹිය යුතුය. ආචාරශීලි නිළධාරියෙකු සංචාරකයන් පිළිගැනීම සඳහා යෙදවීමට උරුම කළමනාකරුවන් කල්පනාකාරි විය යුතුය. මෙහිදි දේශීය හා විදේශීය සංචාරකයන්ට වෙනසක් නොමැතිව පිළිගැනීම කළ යුතුය. සංවරශීලි ඇඳුමකින් නැරඹීම හා වන්දනා කිරීම පෙළඹවීමට උරුම කළමනාකරුවන් ක්‍රියා කල යුතුය. සුදුසු ඇඳුම් සහ හැසිරීම් රටා උරුම ස්ථානයක ආගමික හා සංස්කෘතික ආකල්ප කෙරෙහි ඉතා ඍජුව බලපෑම් ඇති කරයි. පාහියන්ගල භූමියේ මේ සඳහා සුදුසුම ස්ථානය ලෙස මා යෝජනා කරන්නේ ප්‍රධාන සංඝාවාසයට ඉදිරිපසින් ඇති මිදුලයි.

### සංචාරකයන්ගේ ආරක්ෂාව

නරඹන්නන් සහ ඔවුන්ගේ වස්තුවල ආරක්ෂාව සැපයීම උරුම කළමනාකරුවන්ගේ වගකීමකි. අන්තර්ජාතික එකඟතාවය අනුව තමන් නිවසින් පිට රාත්‍රිය ගතකරන්නන් සංචාරකයන් ලෙස හැඳින්වේ. ඔවුන් අතර තමන්ගේ වටිනා දේවල් රැගෙන යන්නෝ ද වෙති. තමන්ට ගැලපෙන දේවල් පමණක් ගෙන යන්නෝ ද වෙති. කෙසේ වෙතත් විශේෂ සංචාරක බෑගයක් සෑම සංචාරකයෙකුටම සතුවේ. ඔවුන් ගෙන යන විශේෂ වටිනා භාණ්ඩ අතර වීඩියෝ පටි, වීඩියෝ කැමරා, ලිපි ලේඛන, සිතියම්, අත්පත්‍රිකා, ගමන් බලපත්‍රය, අවසර පත්‍රය, මිල මුදල් ආදිය ප්‍රධාන වේ. මේවා අරක්ෂා කරදීමට උරුම කළමනාකරුවන්ගේ වගකීමකි. මේ සඳහා විශේෂ ආරක්ෂක සංවිධාන ක්‍රමයක් සැලසුම් කළ යුතුය. යම් හෙයකින් සංචාරකයෙකුගේ වටිනා භාණ්ඩයක් අස්ථානගත වුවහොත් එය සොයා ගැනීමට විධිමත් සැලැස්මක් තිබිය යුතුය. මේ සඳහා ප්‍රාදේශීය පාලනයේ හා ජාතික ආරක්ෂක ප්‍රතිපත්තීන් වල සහයෝගය ලබා ගැනීමට උරුම කළමනාකරුවන් ක්‍රියාකළ යුතුය. වර්තමානයේ පාහියන්ගල භූමියේ මෙවැනි ආරක්ෂක ක්‍රමවේදයක් දක්නට නොමැත. මේ සඳහා පෞද්ගලික අංශයේ ආරක්ෂක සේවාවක් ලබා ගැනීමට යෝග්‍ය බව මාගේ අදහසයි. අවම ලෙස ආරක්ෂකයන් සිව්දෙනෙක් ස්ථාන දෙකක ස්ථානගත කළ යුතුය. ඒ සඳහා සුදුසුම ස්ථාන වන්නේ රථගාල සහ ගල් ලෙන් භූමියයි. එම ස්ථානයන්හි කුඩා කුටි ඒ සඳහා නිර්මාණය කළ යුතුය. මීට අමතරව ආරක්ෂිත කැමරා පද්ධතියක් (CCTV Camera)

සංචාරකයන් බහුතරයක් ගැවසෙන ස්ථානයන්හි සවිකිරීමට වර්තමානයේ හෝ අනාගතයේ දි උරුම කළමනාකරුවන් ක්‍රියාකිරීම වැදගත් වේ.

### දැන්වීම් සහ දැන්වීම් පුවරු මගින් ස්ථානය පිළිබඳ ප්‍රසිද්ධ කිරීම

උරුම ස්ථානයක් අර්ථ ගැන්වීම සඳහා සංචාරකයින් දැනුවත් කිරීමේ ප්‍රධානතම සහ සරලම මාධ්‍යයක් ලෙසට දැන්වීම් සහ දැන්වීම් පුවරු හඳුන්වා දිය හැකිය. දැන්වීම් විවිධාකාර වේ. දිනපතා පළවන ප්‍රසිද්ධ පත්තර, දැන්වීම් පුවරු, හෝටල් හා සංචාරක නිකේතන හා තොරතුරු මධ්‍යස්ථානවල දැන්වීම්, ගුවන් තොටුපල සම්බන්ධීකරණය කරමින් දැන්වීම් ලබාදීම මගින් මෙය ඉදිරිපත් කළ හැකිය. නමුත් මේ සම්බන්ධව කිසිම ක්‍රියාමාර්ගයක් පාහියංගල උරුම කළමනාකරුවන් විසින් ක්‍රියාත්මක කොට නොමැත. ඒ සඳහා ප්‍රධාන වශයෙන් සංචාරක කාර්යාංශ සහ සංචාරක හෝටල් දැනුවත් කොට ඔවුන් හරහා සංචාරකයන් දැනුවත් කළ යුතුය. මේ සඳහා උරුම කළාමනාකරුවන් සක්‍රියව ක්‍රියාකළ යුතුය. ප්‍රධාන මාර්ග, ජනතාව ගැවසෙන ප්‍රසිද්ධ ස්ථාන, නගරයකට ඇතුළු වන හා පිටවන ප්‍රදේශ ආශ්‍රිතව ආදි ස්ථානවල දැන්වීම් පුවරු සවිකළ හැකිය. පාහියන්ගල ආශ්‍රිත ඇති ප්‍රධානතම නගරය වන්නේ බුලත්සිංහල නගරයයි. හොරණ සිට බුලත්සිංහල නගරයට පැමිණෙන විට ඔරලෝසු කණුව සමඟ ඇති හතරමං හන්දියේ වම් දිශාවට වන්නට පාහියන්ගල නාමය සඳහන් කරමින් දැන්වීම් පුවරු කීපයක් සවිකොට ඇත. තවද ගල්කැටිය හන්දිය නමින් හඳුන්වන ස්ථානයේ දැන්වීම් පුවරුවක්ද සවිකිරීම තුළින් සංචාරකයාට ඉතා පහසුවෙන් අදාළ ස්ථානය සොයා ගැනීමට පුළුවන.




**ඡායාරූප අංක 02. බුලත්සිංහල නගරයේ සහ පාහියන්ගල පන්සල් භූමියට ප්‍රවේශවන ස්ථානයන්හි දැන්වීම් පුවරු සවිකර ඇති ආකාරය**

### අත්පත්‍රිකා

උරුම ස්ථානයක් අර්ථ ගැන්වීමේ දි අත්පත්‍රිකා ප්‍රධානතම මාධ්‍යයකි. අත්පත්‍රිකා යනු උරුම ස්ථානයේ ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, ආගමික, සමාජයීය, වාස්තු විද්‍යාත්මක, කලාත්මක හා පාරිසරාත්මක ජෛව විවිධත්වයන් ආදි සියලු විෂයන් පසුබිම කොටගෙන සකස්කරන ලද කෙටි විස්තර පත්‍රිකාවකි. මෙහි ස්ථානය පිළිබඳ හැඳින්වීමක්, කුඩාවට සකස්කරන ලද නිවැරදි සැලැස්මක්, ස්ථානය පිළිබඳ වටිනාකම දැක්වෙන තොරතුරු සහ ඒ

ආශ්‍රිත ස්මාරක, පර්යේෂණ මගින් හමු වූ දත්ත පිළිබඳ කෙටි හැඳින්වීමක් සමඟ ඡායාරූප කිහිපයක් ද තොරතුරු මධ්‍යස්ථාන අංක, උරුම කළමනාකරුවන්ගේ දුරකථන අංක ද අන්තර්ගත විය යුතුය. සරල සුගම භාෂාවෙන් සකස් විය යුතු අතර අත්පත්‍රිකාව අතෙහි ගෙන යා හැකි, පහසුවෙන් පරිහරණය කළහැකි පරිදි හා ඉක්මනට විනාශ නොවන පරිදි සැකසිය යුතුය. පාහියංගල සංචාරක ස්ථානය තුළ අත්පත්‍රිකා කිහිපයක් සංචාරකයන් අතරේ බෙදාදෙයි. පාහියන්ගලට පැමිණෙන විදේශීය සංචාරකයන් අතුරින් වැඩිම සංචාරක පිරිසක් චීන සංචාරකයන් වන අතර ඔවුන්ගේ පහසුව පිණිස චීන භාෂාවෙන් ද අත්පත්‍රිකා සැකසීම වඩාත් යෝග්‍ය වේ.

## මාර්ගෝපදේශක ග්‍රන්ථ

මෙමගින් උරුමයේ වටිනාකම, ඓතිහාසික අගය, එකිනෙක ස්ථාන පිළිබඳ සරල එහෙත් නිරවද්‍ය තොරතුරු සැලසුම් ඇතුළත් කුඩා පොතක් මාර්ගෝපදේශක ග්‍රන්ථයක් ලෙස හඳුන්වයි. පාහියන්ගල පුරාවිද්‍යාත්මක ස්ථානයේ තොරතුරු ඇතුළත් කුඩා ග්‍රන්ථයක් සංචාරකයන් සඳහා අලෙවි කරනු ලැබේ. නමුත් මෙම ග්‍රන්ථය යාවත්කාලීන නොකිරීම නිසා ස්ථානය පිළිබඳ අලුත් කරුණු රාශියක් මඟහැරී ඇත. තවද මෙම ග්‍රන්ථය සිංහල භාෂාවෙන් පමණක් රචනා වීම නිසා විදේශීය සංචාරකයන්ට ස්ථානය පිළිබඳ දළ අවබෝධයක් ලබා ගැනීමට නොහැකි වේ. මේ නිසා මෙම ග්‍රන්ථය යාවත්කාලීන කොට සිංහල, ඉංග්‍රීසි හා චීන භාෂාවෙන් රචනා කොට මුද්‍රණය කිරීම වැදගත් වේ. එමඟින් සංචාරකයින්ට ස්ථානය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගත හැකි අතර සංචාරක ආකර්ෂණය ඉතා ඉක්මනින් ව්‍යාප්ත කළ හැකිය.

## පින්තූර, තැපැල්පත් හා පෝස්ටර්

උරුමයන් නැරඹීමට පැමිණෙන සංචාරකයා සිහිවටනයක් ගෙනයාමට උනන්දුවක් දක්වයි. ඔවුන් වෙනුවෙන් ශාස්ත්‍රීය ග්‍රන්ථයක්, හෝ හිතවතෙකුට යැවීමට හැකි ආකරයේ ස්ථානීය අගය දක්වෙන දර්ශනීය පින්තූර ඇතළත් තැපැල්පතක් හෝ පෝස්ටරයක් මිලට ගැනීමට සැලැස්වීමෙන් උරුම භූමිය නඩත්තුව සඳහා යම්කිසි ආදායමක් උපයාගත හැකිය. මෙවැනි වැඩසටහනක් පාහියන්ගල සංචාරක භූමිය තුළ ක්‍රියාත්මක නොවේ. මේ නිසා විධිමත් ආකාරයට සකස්කරන ලද වෙළඳසැල් මඟින් මෙය ක්‍රියාත්මක කළ හැකිය. මෙහිදී ස්ථානීය අගය මතුවන ආකාරයට සහ එහි අනන්‍යතාවය සුරකින පරිදි සිහිවටන සැකසීම වැදගත් වේ. ෆාහියන් භික්ෂුවගේ අනුරූ සහ චීන සිහිවටන ද සැකසීම වැදගත් වේ. වෙළඳ කුටි හිමියන්ට කිසියම් විදිහකින් පාහියන් උරුම භූමියට ඇතුල් වී වෙළඳාම් කිරීමට අවසරය ලබාදෙන්නේ නම් කරුණු කීපයක් සැලකිල්ලට යුතුය. එනම් සාමාජික සංඛ්‍යාව, ඒ සඳහා යොදා ගන්නා කාලවේලාවන්, බලපත්‍රයේ ස්වභාවය, ප්‍රවේශ ගාස්තු, ලාභය හුවමාරු කරගන්නා විධික්‍රම ආදියයි. වෙළඳකුටි හිමියන් විසින් අලෙවි කරන භාණ්ඩ මොනවාද යන්න සංස්කෘතික ස්ථානය භාර කළමනාකරුවන්ගේ අධීක්ෂණයට ලක්විය යුතුය. ජංගම රථවලට ද වෙළඳාම් කිරීමට ඇතුල්වීමට අවසර ලබාදීම ගැන සලකා බැලිය යුතුය.

**උපදේශකවරු හා මාර්ගෝපදේශක සිතියම්**

උරුම භූමියකට යහපත් ප්‍රචාරණයක් සහ හොඳ නමක් ලැබීමට මගපෙන්වන්නෙක් අවශ්‍ය වේ. මගපෙන්වන්නන් හෝ උපදේශකවරුන්ගේ දක්ෂතා හා ගුණාත්මක භාවය මත මෙය රඳාපවති. වෙනම පුහුණුවක් ලැබූ ජාතික හා ජාත්‍යන්තර භාෂාවන් මනාව හැසිරවිය හැකි පිරිස් මේ සඳහා යොදාගත යුතුය. නිල ඇඳුමක්, ජැකට් එකක්, තොප්පියක් සහ ලාංඡනයක් ඔවුන් පැළඳිය යුතුය. පාහියන්ගල සංචාරක භූමිය තුළ මෙවැනි විධිමත් සංචාරක මගපෙන්වන්නන් නොමැත. ස්ථානීය වශයෙන් යම් යම් කාලපරිච්ඡේදයන්හි විවිධ පුද්ගලයන් සංචාරකයින්ට තොරතුරු බෙදාදීම සඳහා ක්‍රියාකොට ඇත. නමුත් එය විධිමත් ආකාරයට සිදුවී නොමැත. ශ්‍රී ලංකාවට වැඩිම විදේශීය සංචාරකයින් පැමිණෙන්නේ ජර්මන් ජාතිකයන් සහ චීන ජාතිකයන් ය. මෙහිදී සිංහල භාෂාවෙන් පමණක් නොව ඉංග්‍රීසි, චීන හා ජර්මන් භාෂා මනාව හැසිරවිය හැකි සංචාරක මගපෙන්වන්නන් (Tourist Guide) මේ සඳහා යෙදවීම තුළින් සංචාරක ආකර්ෂණය වැඩිදියුණු කරගත හැකිය.

උරුම ස්ථානයක් නැරඹීමට පැමිණෙන සංචාරකයින් වෙනුවෙන් නිවැරදිව සැකසුණු ස්මාරක ස්ථානගත සිතියම් (Guide Map) අවශ්‍ය වේ. යම් ස්ථානයක ස්මාරක කිහිපයක් තිබීමට පුළුවන. මේ නිසා සංචාරකයින් රස්තියාදු නොකොට පහසුවෙන් ගමන් කිරීමට ඉඩකඩ සැලැස්විය යුතුය. මේ සඳහා උරුම ස්ථානයේ සෑම ඉදිකිරීමක්ම අඩංගුවන සේ සිතියමක් සැකසිය යුතුය. මෙවැනි සිතියමක් පාහියන්ගල සංචාරක භූමිය තුළ නොමැති අතර එවැන්නක අවශ්‍යතාවය තදින් මතු වී ඇත.

**සංඥා පුවරු භාවිතය**

නරඹන්නන් දැනුවත් කිරීමේ ප්‍රබල මාධ්‍යයක් ලෙසට සංඥා පුවරු භාවිතය උපයෝගි කරගත හැකිය. උරුම ස්ථානයේ පෙනුමට අනන්‍යතාවයට හානි සිදුනොවන ලෙස මෙය භාවිතා කළ යුතුය. මෙය එකම ආකාරයට පැවැතිය යුතු නොවේ. මෙමගින් නරඹන්නන් නිවැරදි මාවතකට යොමුකළ හැකිය. වැරදි අර්ථ නිරූපණ සහිත පුවරු හෝ වැරදි සංඥා නොයෙදීම උරුම කළමනාකරුවන්ගේ වගකීමකි. මෙය සැලසුම් සහගත කළයුතු අතර සංඥා භාවිතයේ සමස්ත සැලැස්මේ කොටසක් විය යුතුය. ප්‍රමාණය, සැලැස්ම, රූප, වර්ණ, ද්‍රව්‍ය මගින් සැලසුම් කළ යුතුය. කල්පවතින, සිත් ඇදගන්නා, සුළු වර්ණ, පැහැදිලි අක්ෂර භාවිතා කළ යුතුය. ජාතික හා ජාත්‍යන්තර භාෂා යොදාගත යුතු අතර වචන අතර පරතරය, පේළි අතර දුර, අකුරුවල ප්‍රමාණය, පුවරුවෙහි ප්‍රමාණය, පුවරුව තබා ඇති ස්ථානය සහ උස ප්‍රමාණයත් වැදගත් වේ. හැරවුම් ස්ථාන, රැඳවුම් ස්ථාන, වාහන නැවැත්වීමේ ස්ථාන, ප්‍රවේශපත් ලබාගැනීමේ ස්ථාන, පොදු පහසුකම් ස්ථාන, ආපනශාලා, ගිමන්හල්, කඩසාප්පු, වෛද්‍ය ප්‍රතිකාර සහ පොලිසිය හෝ ආරක්ෂක සේවා පිළිබඳ සංඥා පුවරු මගින් දැනුවත් කළ යුතුයි. මේවා සවිකිරීමේ ස්ථාන උරුම කළමනාකරුවන් අවබෝධ කරගත යුතුය. පාහියන්ගල සංචාරක භූමිය තුළ සංඥා පුවරු විධිමත් ලෙස ස්ථානගත කර ඇත. ස්ථානයට

ඇතුල් වීමේ සිට ස්ථානය නරඹා අවසන් වන තුරු මනා මඟපෙන්වීමක් සංඥා පුවරු භාවිතයෙන් සිදුකොට ඇත.

**ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය**

ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ලෙස චිත්‍රපට, සංයුක්ත තැටි, රූපවාහිනී වැඩසටහන් සහ චිත්‍ර කාව සංචාරකයින් දැනුවත් කිරීම සඳහා ඉදිරිපත් කළහැකි අර්ථ දැක්වීමකි. සංයුක්ත තැටි පහසුවෙන් ගෙන යා හැකි ද්‍රව්‍යයක් වන අතර තොරතුරු විශාල ප්‍රමාණයක් ගබඩා කොට තැබිය හැකි නිසා සංචාරකයින් වැඩි ප්‍රියතාවයක් මේ සඳහා දක්වයි. පාහියන්ගල සංචාරක භූමිය තුළ සංචාරකයින් ආකර්ෂණය කරගැනීම සඳහා ස්ථානය පිළිබඳ තොරතුරු ඇතුලත් මිනිත්තු 35 ක් පටිගත කොට ඇති සංයුක්ත තැටියක් අළෙවි වේ. එය සංචාරකයන්ට ස්ථානය පිළිබඳ යම් අවබෝධයක් ලබාගැනීමට ප්‍රමාණවත් වේ.






**ඡායාරූප අංක 04. සංචාරකයන් හැසිරවීම සඳහා භාවිතා කර ඇති සංඥා පුවරු**

**ඇතුල්වීමේ සංචාරක ප්‍රවේශපත් ලබාදීම**

බාධාවකින් තොරව ප්‍රවේශපත්‍ර මිල දී ගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සංචාරකයා සඳහා සලසාදීම උරුම කළමානාකරුවන්ගේ වගකීමකි. මෙහිදි ප්‍රවේශපත්‍ර සංචාරකයාට මිලදී ගැනීම සඳහා පාහියන් උරුම භූමිය තුළ විධික්‍රම දෙකක් සැලසුම් කළහැකිය. (විදේශීය සංචාරකයන්ට පමණි) ප්‍රථමයෙන් උරුම භූමිය අසල ප්‍රධාන කාර්යාලය මඟින් ද, දෙවැනුව පූර්ව දැනුම්දීමක් මඟින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් කණ්ඩායම් ප්‍රවේශපත්‍රයක් මිලදී ගැනීම වශයෙනි. සෑම ප්‍රවේශ පත්‍රයකම මිල ගණන් ඉතා පැහැදිලිව සංචාරකයාට දැකබලා ගතහැකි අයුරින් ප්‍රදර්ශනය කළ යුතුය. මේ නිසා සංචාරකයාට තම පෞද්ගලික අභිමතය පරිදි ප්‍රවේශපත්‍ර මිලදී ගැනීම සඳහා පහසුවක් ඇති කරයි. එමෙන්ම විදේශ සංචාරකයාට ඒවා තේරුම්ගත හැකිවන පරිදි ජාත්‍යන්තරව පිළිගත් භාෂා කිහිපයක් (චීන භාෂාව ඇතුළුව) මඟින් නිරවුල්ව ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමුකිරීම වැදගත් වේ. මේ සඳහා පාහියන් උරුම භූමියේ ප්‍රවේශපත්‍ර කවුළුවක් (Ticket Counter) ස්ථාපිත කළයුතු අතර ඒ සඳහා සුදුසුම ස්ථානය වන්නේ සංඝාවාසයට ඉදිරිපසින් ඇති මිදුලේ එක් පැත්තකට වන්නය.

### උරුම භූමිය තුළට රථවාහන ඇතුළු කිරීම යාමනය කිරීම

පාහියන්ගල උරුම භූමිය නැරඹීමට පැමිණෙන විශාල සංඛ්‍යාවක් පැමිණෙන්නේ රථවාහන වලිනි. මෙම රථවාහන සියල්ලක්ම උරුම භූමියට ඇතුළු කිරීමෙන් වාහන තදබදයක් ඇතිවේ. එය ස්ථානය නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට ද විශාල බාධාවකි. මේ නිසා උරුම කළමනාකරුවන් රථවාහන නවතාතැබීම සඳහා, උරුම භූමියට නුදුරින් රථගාලක් ස්ථානගත කළ යුතුය. විදේශීය සංචාරකයන් සඳහා පන්සල ඇතුළත රථගාලද දේශීය සංචාරකයන් සඳහා පන්සලින් පිටත රථගාලද ස්ථාපනය කළ යුතුය. රථවාහනවල ආරක්ෂාවත්, උරුම භූමියේ නඩත්තුව සඳහා ටිකට් පතක් නිකුත් කිරීමට ද පියවර ගතයුතුය.



**ඡායාරූප අංක 06. උරුම භූමියේ රථවාහන නවතා ඇති ආකාරය**

### සංරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම

පාහියන්ගල උරුම ස්ථානයට පැමිණෙන නරඹන්නන්ගේ ප්‍රමාණය අතිවිශාලය. පුරාවිද්‍යා ස්ථානයේ බෝධිය පිහිටා ඇති වැට, ගල් රැන්ද සමීපයේ ඇති කුටිය, අවිධිමත් ගල්බැම් විශ්‍රාම ශාලාව ආදි ගොඩනැගිලි සංරක්ෂණය හා නැවත ගොඩනැගීම් කළ යුතුය. මිනිස් ක්‍රියාකාරකම් මගින් සිදුවන හානි, සතුන්ගෙන් සිදුවන හානි සඳහා සංරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමට උරුම කළමනාකරුවන් උත්සාහගත යුතුය.

### උරුම කළමනාකරණය මගින් සංවර්ධනය විය යුතු යටිතල පහසුකම්

උරුම ස්ථානයක සංචාරක කර්මාන්තය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ඉතා වැදගත්වන යටිතල පහසුකම් රාශියක් ඇත. ස්ථානීය සංචාරක පහසුකම් සැපයීමට උරුම කළමනාකරුවන්ට දැඩි සුපරික්ෂාකාරිව සිටීමට සිදුවේ. විවිධ ජාතික සහ අන්තර්ජාතික සංචාරකයින් උරුම ස්ථානයට පැමිණීමේ දී විවිධ වූ සංස්කෘතීන් සමඟ ඔවුන්ගේ පැමිණීම අපේක්ෂා කළ යුතුය. ඔවුන් සඳහා විවිධ තරාතිරමේ වාසස්ථාන තිබිය යුතුය. එබඳු වාසස්ථාන පහසුකම් සැලැස්වීමට උරුම කළමනාකරුවන්ට රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහයෝගය අවශ්‍ය වේ.

පාහියන්ගල සංචාරක භූමිය තුළ දේශීය හා විදේශීය සංචාරකයින්ට අවශ්‍යම පොදු පහසුකම් කීපයක් හඳුනාගත හැකිය. එම පහසුකම් වර්තමානයේ නොමැතිකම නිසා සංචාරකයන් බොහෝ අපහසුතාවයට පත්වේ. සංවර්ධනය වියයුතු අවශ්‍යම යටිතල පහසුකම් කීපයක් සංවර්ධන වැඩසැලැස්ම ඔස්සේ මෙසේ දැක්විය හැකිය.

01. වාසස්ථාන පහසුකම්

02. ආහාර වෙළඳසැල්

03. සනීපාරක්ෂක සේවා

04. ජලය සහ විදුලිය

05. තැපැල්, දුරකථන සහ බැංකු සේවා පහසුකම්

06. වෛද්‍ය පහසුකම්

07. කැලිකසල ඉවත්කිරීම සහ අපද්‍රව්‍ය බැහැර කිරීම

**වාසස්ථාන පහසුකම්**

වාසස්ථාන වූ කලි සංචාරකයාගේ මූලික අවශ්‍යතාවයකි. සංස්කෘතික භූමියක පිහිටි හෝටලයක් එම ස්ථානයට ඉතා වටිනා වූ සේවාවකි. එය එක් අතකින් ක්‍රියාකාරී පහසුකම්වලට වඩා වැඩි යමක් තිබීම අවශ්‍ය වේ. සංචාරක වාසස්ථාන වර්ගීකරණය කිරීමේ දි හෝටල්, ආගන්තුක සංචාරක නිකේතන (Guest House), කඳවුරු බැඳීම (Camping) ආදී වර්ගීකරණයන් කිහිපයක් ඇත. (ගුණවර්ධන,2008) පාහියන්ගල සංචාරක භූමියේ හෝ ඒ ආශ්‍රිත හෝටල් ස්ථාපනය වී නොමැති අතර කිලෝමීටර් 26 ක් දුරින් පිහිටි කළුතර නගරයේ සංචාරකයන්ට සුවපහසු හෝටල් නිර්මාණය වී ඇත. එය යම්තාක් දුරට ප්‍රමාණවත් වේ. ආගන්තුක සංචාර නිකේතන ද සංචාරකයන් සඳහා සුදුසු වාසස්ථාන වේ. පාහියන්ගල උරුම භූමිය අසල මෙම නිකේතන පිහිටවිය හැකි අතර ඒ සඳහා සුදුසු ව්‍යාපාරිකයන් සම්බන්ධ කරගනිමින් උරුම කළමනාකරුවන් ක්‍රියාකළ යුතුය.

සාමාන්‍යයෙන් උරුම භූමියකට පැමිණෙන සංචාරකයන් සඳහා කඳවුරු ක්‍රමය ද නිකේතනකරුවන් විසින් සලසාදිය යුතුය. සංචාරනයන්ගේ සිතැඟි පරිදි මෙය සිදුවිය යුතුය. එහෙත් වන සතුන් නැරඹීමට හෝ ස්වභාව සෞන්දර්යය සඳහා උරුම භූමිය වටා ඇති ස්ථානයක කඳවුරු බැඳීම කළමනාකාරිත්වයේ අනුමැතිය මත සිදුවිය යුතුය. විශේෂයෙන් පුරාවිද්‍යා භූමියක පිළිපැදිය යුතු නීතිරීති සහ වනජීවී, වන සංරක්ෂණ ආයතනවල මැදිහත් වීම මෙයට බලපායි. තාවකාලික එක් රාත්‍රියක් හෝ දින කිහිපයක් සඳහා වුවත් අවශ්‍ය අවසරය අදාළ ආයතනය මගින් ලබා ගැනීම සංචාරකයන්ගේ ආරක්ෂාවට වැදගත් වේ.

පාහියන්ගල ගල් ලෙන් මුදුනේ මේ සඳහා සුදුසු භූමි ප්‍රදේශ විශාල ප්‍රමාණයක් ඇත. ඒ සඳහා සංචාරකයන් ආකර්ෂණය කරගැනීමට සහ අවශ්‍ය පහසුකම් සලසා දීම උරුම කළමනාකරුවන්ගේ වගකීමකි.

**ආහාර වෙළඳසැල් පාලනය කිරීම**

සංචාරකයින්ට ප්‍රධාන අවශ්‍යතාවයකි ආහාර. බොහෝ වේලාවක් සංචාරක ආකර්ෂණීය ස්ථාන නැරඹීමෙදි විශාල කාලවේලාවක් ගතකිරීම සිදුවේ. සංචාරකයාගේ වෙහෙස නිවා ගැනීමේ දි ස්ථානය තුළ ආහාර සැපයීම සඳහා අහාර ලබාගැනීමට හැකි සේවාවන් ඇති කිරීම වැදගත්ය. පිරිසිදු ආහාර පාන ලබාදීමට උරුම කළමනාකරුවන් ක්‍රියාකළ යුතුය. ප්‍රමිතියකින් තොරව ආහාර සකස් කිරීම හෝ වෙළඳාම් කිරීමට අවසර නොදිය යුතුය. සංචාරකයින් ආස්වාදයේ විවිධත්වයක් ලෙස ආහාරපාන රස විඳීම දැක්විය හැකිය. දේශීය හා විදේශීය ආහාරපාන පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව අසුරා සංචාරකයින්ට නිශ්චිත සාධාරණ මිළකට ලබාදීමට කටයුතු කළ යුතුය. විදේශීය සංචාරකයින්ට දේශීය ආරට සකස් කළ ආහාරපාන ලබාදීමට වැඩි ප්‍රවණතාවක් හා දේශීය සංචාරකයින්ට ඔවුන් කැමති ආකාරයට විවිධත්වයක් ලබා ගැනීමටත් ආහාරපාන ලබාගත ස්ථාන සංවිධානය කළ යුතුය. පෞද්ගලික ස්ථාන සඳහා බලපෑම් අතිකල නොහැකි වුවහොත් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක හරහා හදිසි වැටලීම් කළ යුතුය. එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය, වෙළඳාම් හා රැස්කිරීම් හා නීති විරෝධිව පවත්වාගෙන යන්නන් සහ ස්ථානවලට විරුද්ධව නීතිමය කටයුතු කිරීමට උරුම කළමනාකරුවන් වගබලා ගත යුතුය.

පාහියන් උරුම භූමිය තුළ වෙළඳසැල් පවත්වා ගෙන ගියද ඒවා නිසි ප්‍රමිතියකින් යුක්ත නොවේ. උරුම භූමිය තුළ වෙළඳසැල් ස්ථානගත වීමද සැලසුමකට අනුව සිදුවී නොමැත. බොහෝ විට මෙහි දක්නට ලැබෙන්නේ ජංගම වෙළඳසැල්ය. මේ තත්ත්වය නිසා ආහාරවල ප්‍රමිතිය ආරක්ෂා කරගැනීමට අපහසු වී ඇත. මෙහි සංවර්ධන වැඩ සැලැස්ම ඔස්සේ ස්ථිර වෙළඳසැල් කීපයක් සැකසිය යුතුය. ඒවායේ ආහාර ප්‍රමිතිය සතිපතා පරීක්ෂා කළ යුතුය. මෙම වෙළඳසැල් ඔස්සේ විවිධ ආහාර රටා සංචාරකයින්ට රස විඳීමට ලබාදිය යුතුය. එමගින් අලුත් ආස්වාදයක් සංචාරකයන්ට ලබාදිය හැකිය. පාහියන් උරුම භූමියේ මෙම වෙළඳසැල් ස්ථානගත කිරීමට වඩාත් යෝග්‍ය ස්ථානය වන්නේ රථගාලයි.



**ඡායාරූප අංක 09. උරුම භූමියේ විධිමත් වෙළඳසැල් නොමැති කමින් තැනින් තැන වෙළඳසැල් ස්ථානගත වී ඇති ආකාරය**

**සනීපාරක්ෂක සේවා**

ඉතා යහපත් සෞඛ්‍යාරක්ෂිත සනීපාරක්ෂක සේවාවන් සංචාරකයන් වෙනුවෙන් ලබාදිය යුතුය. මෙය සංචාරක භූමියක අනිවාර්ය අංගයකි. පාහියන්ගල සංචාරක භූමිය තුළ සනීපාරක්ෂක සේවාවන් ඉතා අවම මට්ටමක පවතී. සතියේ නිවාඩු දිනවල දහස් ගණනක් සංචාරකයින් පාහියන්ගලට පැමිණෙන නමුත් ඔවුන් සඳහා අවශ්‍ය සනීපාරක්ෂක කටයුතු ප්‍රමාණවත්ව නැත. ඒ සඳහා කඩිනමින් සම්පූර්ණ පහසුකම් ඇතිව විධිමත් සනීපාරක්ෂක ගොඩනැගිල්ලක් සැකසිය යුතුය. එමෙන්ම ස්ත්‍රී හා පුරුෂ පක්ෂයන්ට අදාළ වැසිකිළි පහසුකම් ප්‍රධාන දොරටුව තදාශ්‍රිතයේ පිහිටුවීමට අත්‍යාවශ්‍ය වේ. මේ සියල්ල ජාත්‍යන්තර සංඥා පුවරු භාවිතා කරමින් ප්‍රදර්ශනය කළ යුතුය. ඒ සඳහා තත් ස්ථානයේ සුදුසු ස්ථානය ලෙස මා යෝජනා කරනු ලබන්නේ දානශාලා ගොඩනැගිල්ලට පිටුපස ප්‍රදේශයයි.



**ඡායාරූප අංක 10. උරුම භූමියේ අවිධිමත් සනීපාරක්ෂක පහසුකම්**

**ජලය සහ විදුලිය**

උරුම ස්ථානයක් නැරඹීමට පැමිණෙන සංචාරකයන් ජලය සහ විදුලිය රැගෙන නොපැමිණෙති. මේ නිසා එම අවශ්‍යතාවයන් උරුම කළමනාකරුවන් විසින් සකසා දිය යුතුය. පානීය ජල පද්ධති ක්‍රමවත් හා සෞඛ්‍යාරක්ෂිතව සැලසුම් කළ යුතුය. මෙහිදී විවෘත අවකාශයක් තුළ ජල අවශ්‍යතා සපුරාගත හැකි පරිදි ජලනල පද්ධතියක් මඟින් පිරිසිදු ජලය ලබාදීමට හැකිය. පාහියන් ලෙනට පිවිසීමට පියගැට 350 ක් පමණ තරණය කළ යුතුය. එය වෙහෙසකල කටයුත්තකි. මේ නිසා ස්ථාන තුනක පමණ ජල ටැංකි හෝ ජලනල පද්ධති සකස් කළ යුතුය. එමඟින් සංචාරකයන්ගේ විඩාව දුරුකර ගත හැකිය. ඒ සඳහා මා යෝජනා කරනු ලබන්නේ රථගාල, ප්‍රධාන පාර සහ පඩි පෙල එකතුවන ස්ථානය සමඟින් ගල් ලෙන් භූමියයි. රාත්‍රියාමයේ පැමිණෙන සංචාරකයින්ට ස්ථානය හොඳින් බලාගැනීමට හැකිවන සේ විදුලි ආලෝකය සපයා තිබිය යුතුය. පාහියන් ලෙන තුළ මෙම පහසුකම අවම මට්ටක පවතී. මීට අමතරව කැමරා, ජංගම දුරකථන නැවත සක්‍රිය කරගැනීමට අවශ්‍ය පහසුකම් සැලැස්විය යුතුය.

**තැපැල්, දුරකථන සහ බැංකු සේවා පහසුකම්**

සංචාරකයන් සඳහා වැදගත් සේවාවක් ලෙස මෙම සේවාව සැලකිය හැකිය. විදේශීය සංචාරකයින්ට පණිවුඩ යැවිය හැකි සහ විදේශීය මුදල් හුවමාරු කරගත හැකි ආකාරයේ

තැපැල්, දුරකථන සහ බැංකු සේවා පවතවාගෙන යාමට රජයට සහ පළාත් ආයතනවලට සහයෝගය දැක්විය යුතුය. එමගින් සංචාරක පහසුකම් තීව්‍ර කළ හැකිය. පාහියන් සංචාරක භූමිය තුළ දුරකථන පහසුකම් ස්ථාපනය කළහැකි අතර තැපැල් සහ බැංකු සේවා පහසුකම් සංචාරක ස්ථානයට ආසන්නයේ ඇති බුලත්සිංහල නගරයේ පිහිටා ඇත. මේ සඳහා ප්‍රාදේශීය නගරයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) ආයතනය සමග ඒකාබද්ධ වී පොදු දුරකථන පහසුකම් සංචාරකයින් වෙනුවෙන් සැලසීම උරුම කළමනාකරුවන්ගේ වගකීමකි. දුරකථන භාවිතා කිරීම සඳහා උපදෙස් ජාත්‍යන්තර පිළිගත් භාෂා යොදා ගනිමින් ඉදිරිපත් කළයුතුය. මුදල් ගෙවීමක් සිදුකොට තම අවශ්‍යතාවය ඉටුකර ගැනීමට කටයුතු සැලැස්විය යුතුය. දුරකථන පහසුකම් ස්ථානගත කිරීමට මා යෝජනා කරනු ලබන්නේ පාහියන් සංරක්ෂණ හා සංවර්ධන පදනමේ කාර්යාලයයි.

**වෛද්‍ය පහසුකම්**

උරුම භූමිය නැරඹීමට පැමිණෙන සංචාරකයින් වෙනුවෙන් හදිසි අවශ්‍යතාවයකදී සහ සාමාන්‍ය අවශ්‍යතා සඳහා වෛද්‍ය පහසුකම් ඇතිකිරීමේ දි සහ ක්‍රියාත්මක කිරීමේ දි රජයට සහ පෞද්ගලික අංශයට සහයෝගය ලබාදීමට උරුම කළමනාකරුවන් වගබලා ගතයුතුය. පෞරාණික ස්ථානවලදි සංචාරකයන්ට විවිධ අනතුරු සිදුවිය හැකිය. (සතුන්ගෙන්, මිනිසුන්ගෙන් හා ස්වභාවික විපත්) පාහියන් උරුම භූමිය තුළද හදිසි ගල් පතුරු කඩාවැටීම්, පියගැට ලිස්සා තුවාල වීම් සහ බඹර ප්‍රහාරවලට ගොදුරුම් ආදි අනතුරු සිදුවිය හැකිය. මෙවැනි අවස්ථාවක සුදුසු වෛද්‍ය පහසුකම් ලබාදීමට උරුම කළමනාකරුවන් ක්‍රියාකළ යුතුය. ඒ සඳහා ප්‍රථමාධාර මධ්‍යස්ථානයක් ස්ථාපිත කළ යුතුය. පාහියන්ගල උරුම භූමිය තුළ මෙවැනි වෛද්‍ය පහසුකම් නොමැති අතර කිලෝමීටර් 5 ක් දුරින් බුලත්සිංහල නගරයේ මූලික රෝහල පිහිටා ඇත. එය වෛද්‍ය පහසුකම් සඳහා ප්‍රමාණවත් වේ.

**කැලිකසල ඉවත්කිරීම සහ පරිසරය පිරිසිදුව පවත්වාගෙන යාම**

සංචාරක ආකර්ෂණය සංස්කෘතික ස්ථානයක් සඳහා නිරතුරුවම ලබාගැනීමට පරිසරය පිරිසිදුව හා ක්‍රමවත් අයුරින් නඩත්තු කිරීම වැදගත් වේ. එහිදි කදිමට සැලසුම්කළ, කල්පවතින භාජන සුදුසු පරිදි භූමියේ අවට ස්ථානගත කොට, අපද්‍රව්‍ය එම කසළබඳුන්හි දැමීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. එම කසළ භාජන සඳහා ජාත්‍යන්තර පිළිගත් සංකේත භාවිතා කරමින් ඒ ඒ ද්‍රව්‍ය වෙන වෙනම එකතුකර ප්‍රතිචක්‍රීකරණයට යොමුකළ හැකිය. සති අන්ත දිනයන්හි සහ පෝය දිනවලදි පාහියන් උරුම භූමියේ කැලිකසල බහුල වශයෙන් දක්නට ලැබේ. මෙහි කසළබඳුන් ස්ථාන ගතකිරීමක්ද නියමාකාරව සිදුකොට නොමැත. පාහියන්ගල යනු ස්වභාවික වනාන්තරයකින් වට වු රමණීය භූමි ප්‍රදේශයකි. එහි

ආශ්වාදය සංචාරකයන්ට ඒ ආකාරයෙන්ම ලබාදිය යුතුය. ඒ සඳහා උරුම භූමිය පිරිසුදුව පවත්වා ගෙනයාම වැදගත් වේ.





**ඡායාරූප අංක 11. උරුම භූමියේ විධිමත්ව කසළබඳුන් ස්ථානගත නොවීම හා ගල් ලෙනේ විවිධ කුරුටු ගීත ලියා ඇති ආකාරය**

**පාහියන්ගල සංචාරක පුරවරයක් ලෙස සංවර්ධනය කළහැකි වෙනත් ප්‍රවණතා**

සංචාරක ව්‍යාපාරයේ පදනම ලෙස සැලකෙනුයේ පරිසරයයි. මුහුදු වෙරළවල්, දියඇලි, වනාන්තර, වනසතුන් ආදී ස්වභාවික පරිසරය හෝ චේවා වෙහෙර, විහාර, දාගැබ්, වැව්, අමුණු, පුරාවිද්‍යා ස්ථාන ආදී මානව නිර්මිත පරිසරය හෝ චේවා ආගමික, සංස්කෘතික හා සමාජීය ක්‍රියාකාරකම් ඇතුළත් වූ මානව පරිසරය හෝ චේවා මේ සියල්ල සමස්තයක් වශයෙන් ගතහොත් සංචාරක ගමනාන්තයකට සංචාරකයන් ආකර්ෂණය බවට පත් වී තිබේ. මේ නිසා සංචාරකයන් විශාල වශයෙන් සංචාරක ගමනාන්තයකට පැමිණීම නිසා වැඩි බලපෑමක් ඇති කෙරෙන ප්‍රධානතම සංචාරක ආකර්ෂණය බවට පත් වී තිබේ. සංචාරක කර්මාන්තයට නව අංග එකතුවීම මත දිනෙන් දිනෙන් වර්ධනයක් දක්නට ලැබේ. එම නව අංගයන් ලෙස රූ දෙස් සංචරණය (Eco Tourism), හරිත සංචරණය (Green Tourism), වගකීමක් සහිත සංචරණය (Responsible Tourism), පරිසර මූලික සංචරණය (Nature Based Tourism), ආධ්‍යාත්මික සංචරණය (Spiritual Tourism), ත්‍රාසජනක සංචරණය (Adventure Tourism), ගුහා සංචරණය (Cave Tourism), ක්‍රීඩා සංචරණය (Sport Tourism), සංස්කෘතික සංචරණය (Culture Tourism) ආදී සංචාරක උපනතීන්වල වර්ධනයක් දක්නට ලැබේ.

පාහියන්ගල සංචාරක භූමිය තුළ නව සංචාරක පුරවරයක් ලෙස සංවර්ධනය කිරීමේ දී එකතු කළහැකි නව සංචාරක අංග කිහිපයක් ඇති බව මාගේ විශ්වාසයයි. එනම් රූ දෙස් සංචරණය, ගුහා සංචරණය, ආධ්‍යාත්මික සංචරණය යන ආදි සංචරණ අංගයන්ය. පුරාවිද්‍යා, ආගමික, ඓතිහාසික වශයෙන් සංචාරයේ යෙදෙන සංචාරකයන් පාරිසරික සංචරණය කෙරෙහි යොමු කරලීම දුෂ්කර නොවේ. මේ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම උරුම කළමනාකරුවන්ගේ වගකීමකි. පාහියන්ගල සංචාරකයන්ට තෝතැන්නක් වූ පාහියන්ගල පරිසරය ජෛව විවිධත්වයෙන් පිරිපුන් පාරිසරික කලාපයකි. විවිධ වන සතුන් හා කුඩා දියඇලි වලින් යුක්ත මෙම වන අරණ සිංහරාජ වන අඩවියට නෑකම් කියයි. පාහියන්ගල සංචාරක

භූමිය යනු අක්කර 585 කින් යුක්ත විශාල භූමියකි. එම භූමියෙන් අක්කර 25 ක භූමි ප්‍රමාණයක ගොඩනැගලි ඉදිකිරීම් සිදුකොට ඇති අතර ඉතුරු සියලුම භූමි ප්‍රමාණය සංචාරක ආකර්ෂණය වෙනුවෙන් භාවිතයට ගත හැකිය. ස්ථානයට පැමිණෙන සංචාරකයන්ට නව සංචාරක උපනතීන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. දැනුවත් කිරීමේ දී ලේඛන කර ඇති අත්පත්‍රිකා, පෝස්ටර්, මාගෝපදේශන ග්‍රන්ථවල පාහියන්ගල ජෛව විවිධත්ව සහ පාරිසරික ලක්ෂණ පිළිබඳ සඳහන් කළ යුතුය. උරුම පිළිබඳ හා පාරිසරික විවිධත්වයන් පිළිබඳ විශාල පරිමාණයේ ප්‍රදර්ශන පුවරු ප්‍රදර්ශනය කළ යුතුය. මෙහිදී එහි පාරිසරික භූ දර්ශනය, ජෛව විවිධත්වය සහ එය නැරඹිය හැකි ආකාරයත්, නැරඹිය හැකි ස්ථාන පිළිබඳවත්, ගමන් කළහැකි මාර්ග පිළිබඳ තොරතුරු ඇතුළත් විය යුතුය. සංචාරකයන් පාරිසරික සංචරණය සඳහා යොමු කිරීමට අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. අවට ඇති කඳු පද්ධති, ජල මාවත්, ලෙන්, සත්ත්ව ප්‍රජාව දැනුවත් කළ යුතුය. එමෙන්ම ස්ථානය නැරඹිය හැකි ආකාරයත් එයින් ලබාගත හැකි ආධ්‍යාපනික සහ විනෝදාත්මක අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමෙන් පාරිසරික සංචාරකයන් වර්ධනය කරගත හැකිය.







**ඡායාරූප අංක 12. සංචාරකයන්ට උරුම භූමිය පිළිබඳ පුවරු මගින් දැනුවත් කරමින්**

එමෙන්ම ගුහා සංචරණය හා ආධ්‍යාත්මික සංචරණය සඳහා ද සංචාරකයන් ආකර්ෂණය කළහැකි භූමි පරිසරයකින් පාහියංගල යුක්තය. පාහියන්ගල ගල්ලෙන වටා කුඩා ගල් ලෙන් 15 ක් පමණ දක්නට ලැබේ. ස්ථානයට පැමිණෙන සංචාරකයන් ගුහා සංචරණය කෙරෙහි රුචිකත්වයක් ඇතිවන පරිදි උරුම කළමනාකරුවන් ක්‍රියාකළ යුතුය. ඒ සඳහා කුඩා ලෙන්වලට යන මංමාවත් නියමාකාරයෙන් සකසා එහි ආරක්ෂාව තරකළ යුතුය. මාර්ගෝපදේශක සේවාවද මේ සඳහා අනිවාර්ය කළ යුතුය.

ආධ්‍යාත්මික සංචරණය කෙරෙහිද සංචාරකයන් ආකර්ෂණය කළහැකි පරිදි ක්‍රියාකිරීමට උරුම කළමනාකරුවන්ගේ වගකීමකි. ඒ සඳහා සුදුසු පරිසරයක් ස්ථානයේ පිහිටා ඇත. වර්තමාන සංවර්ධන සැලැස්ම මගින් ස්ථානයේ විශාල භාවනා මන්දිරයක් ඉදිකොට ඇති අතර, සහ භාවනා කුටි 50 ක් ඉදිකිරීමට සැලසුම් සකස්කොට ඇත. මේ සඳහා බෞද්ධ උපදේශනය අවශ්‍ය පරිදි සංවිධානය වී නොමැති අතර, ඒ සඳහා අවශ්‍ය කරන උපදේශන සහය සංචාරකයන්ට ලබාදීමට උරුම කළමනාකරුවන් උත්සාහගත යුතුය.




**ඡායාරූප අංක 13. සංචාරකයන්ට ස්ථානය පිළිබඳ දැනුවත් කිරීම, පාවහන් සුදුසු ස්ථානයේ තැන්පත් කිරීම, අත්වැට සුදුසු ස්ථානයන්හි සැකසීම ආදිය පෙන්වා දිය හැකිය.**

පාහියන්ගලට පැමිණෙන සංචාරකයන් අතරින් වැඩිම විදේශීය සංචාරක පිරිසක් නියෝජනය කරනු ලබන්නේ චීන සංචාරකයන්ය. එයට ආසන්නතම හේතුව වී ඇත්තේ පාහියන් භික්ෂුව මෙම ස්ථානයට වැඩම කිරීමක් පිළිබඳව චීන සංචාරකයන් අතර ඇති බලවත් විශ්වාසයයි. මේ නිසා ස්ථානය නැරඹීමට පැමිණි සංචාරකයෙකු වූ **මසමෝරි නකමුරා** නම් චීන දානපතියා විසින් විහාරස්ථානයේ වැඩසිටින භික්ෂූන් වහන්සේලා සඳහා කාමර 14 කින් යුක්ත විශාල සංඝාවාසයක් ඉදිකරන ලදි. එවැනි ආකර්ෂණීය බවක් චීන සංචාරකයන් සතුය. උරුම කළමනාකරුවන් විසින් එවැනි සංචාරකයන් හඳුනාගෙන ඔවුන් උරුම ස්ථානයට ආකර්ෂණය කරගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස්කළ යුතුය. අමිල වටිනාකමකින් යුතු මෙම ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා සංචාරක ස්ථානයේ මනා සුරක්ෂිත භාවය සඳහා සහ දිගු කාලීන පැවැත්ම උදෙසා පහත දැක්වෙන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා මා යෝජනා කරමි.

- ස්ථානය ශ්‍රී ලාංකික හා විදේශීය සංචාරකයන් අතර ජනප්‍රිය කරවීම පිණිස පාහියන් දිනය (Fa-hiyan Day) නමින් දිනයක් නම් කිරීමට මා යෝජනා කරමි. එම දිනය නිමිත්තෙන් චීන තානාපති කාර්යාලය හා එක්ව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. පාසල් ළමුන්, සංචාරක උපදේශකවරු, ප්‍රාදේශීය මන්ත්‍රීවරු හා විද්වත් ජනයා මේ සඳහා සහභාගි කරගත යුතුය. මෙහිදී රචනා තරඟ, ශාස්ත්‍රීය සම්මන්ත්‍රන, ප්‍රදර්ශන මැදිරි මේ සඳහා සූදානම් කළ යුතුය. මෙමගින් විනෝදාස්වාදයක් මෙන්ම ස්ථානය පිළිබඳ ජනප්‍රියත්වයක් ද ලැබේ.
- දැනට අක්‍රමවත්ව පවතින පාහියන් සංරක්ෂණ හා සංවර්ධන පදනම සක්‍රිය කිරීමට ක්‍රියාකිරීම වැදගත් වේ. දිනෙන් දින හෝ සතිපතා ස්ථානයේ තොරතුරු ඇතුළත් www.pahiyangala.org අන්තර්ජාල වෙබ් පිටුව යාවත්කාලීන කිරීමට උරුම කළමනාකරුවන් ක්‍රියාකළ යුතුය. එමගින් ස්ථානය පිළිබඳ අලුත් තොරතුරු හා සංචාරක පහසුකම් පිළිබඳ සංචාරකයන්ට ඉක්මනින් දැනගැනීමට අවස්ථාව උදාවෙයි.

- උරුම භූමියේ ගල මුදුනට නැගීමට ඇති කුඩා අඩිපාර විධිමත් ලෙස සකසා පියගැට පෙලක් නිර්මාණය කිරීම සංචාරකයන්ට පහසුවක් ඇති කරයි.
- තව ද මෙම ස්ථානයෙන් මෙතෙක් ලැබී ඇති පුරා වස්තු අන්තර්ගත කොට පුරාවිද්‍යා කෞතුකාගාරයක් මෙම ස්ථානයේ ඉදි කරන්නේ නම් යෝග්‍ය යැයි සිතමි. එවිට මෙම ස්ථානය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට එම පුරා වස්තු නැරඹීමේ භාග්‍ය උදාවන අතර ඒ හරහා ස්ථානයේ ඇති වටිනාකම පිළිබඳව ද මනා අවබෝධයක් ලබා ගත හැකිය. එසේ ම කැණීම් වලින් ලද සමහර පුරා වස්තු කිසිඳු ආරක්ෂාවක් නොමැතිව ලෙන් පරිශ්‍රයේ තැන තැන තබා තිබෙනු දක්නට හැකිය. මෙම ස්ථානයේ පුරාවිද්‍යා කෞතුකාගාරයක් ඉදි වන්නේ නම් එම ප්‍රශ්නයට ද උත්තර සැපයෙනු ඇත. පාහියන්ගල සංචාරක ආකර්ෂණයට අවශ්‍යම ඉදිකිරීමක් ලෙස කෞතුකාගාරය සැලකිය හැකිය.

- මෙම ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා ස්ථානය නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරයකයන් මෙම ස්ථානය කරා නිබඳව පැමිණෙයි. මොවුන්ගෙන් පුරාවිද්‍යා ස්ථානයේ පුරා වස්තුන්ට දැනුවත්ව හෝ නොදැනුවත්ව වන හානිය තක්සේරු කළ නොහැක. මෙම ස්ථානයේ දැකිය හැකි කැණීම් වළවල් තුළට පවා පැමිණෙන සංචාරකයන් බසින අයුරු දැකිය හැකිය. එසේ ම ලෙන් බිත්තියේ විවිධාකාරයේ කුරුටු ගෑම් සිදු කරනු ද දැකිය හැකිය. මේ ආදී විවිධ අයුරින් පුරාවිද්‍යා ස්ථානයට වන හානිය වළක්වා ගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හරහා මෙම ස්ථානයේ සේවයට පුද්ගලයෙකු යොදවන්නේ නම් යෝග්‍ය යැයි සිතමි. මන්ද මෙවැනි වටිනා පුරාවිද්‍යා ස්ථාන ලෝකයේ ම ඇත්තේ අතලොස්සක් වන බැවිනි.

- මෙම ගුහා ක්ෂේත්‍රය අවට පරිසරය අද වන විට දැව ජාවාරම් කරුවන්ගේ සහ වගා සඳහා එළි පෙහෙළි කරන්නන්ගේ දැඩි තර්ජනයට ලක්ව ඇති බව පෙනී යයි. එම තත්ත්වය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මෙහි පවතින ශාකායනයට සහ සත්ත්වායේ විනාශයට හේතුවේ. මෙම ස්ථානයේ ජෛවවිවිධත්වය හා අවට පරිසරය ආරක්ෂා කර ගැනීමට විධිමත් වැඩපිළිවෙළක් යොදන්නේ නම් මැනවි. එහි දී වනජීවී ආරක්ෂක නිලධාරීන් ද සම්බන්ධ කර ගනිමින් ඒ සඳහා ක්‍රියාත්මක විය හැකිය.

- එසේ ම මෙම පරිසරය අවට කලාපයේ දැකිය හැකි වෘක්ෂ ලතා ආදිය පිළිබඳව සංචාරකයන්ගේ අවබෝධය සඳහා ඒවායේ නම් සඳහන් නාම පුවරු ඉදිරිපත් කිරීම ද වටී.

- මෙහි සියලු සංවර්ධන කටයුතු සඳහා මිනිස් ශ්‍රමය අනිවාර්ය වූ අංගයකි. එබැවින් උරුම කළමනාකරුවන් විසින් ස්ථානයේ පැවැත්මට අවශ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. ඔවුන් සේවය සඳහා යොදවන ස්ථානය, දෛනික හෝ මාසික වැටුප, සේවය සඳහා අවශ්‍ය සුදුසුකම් ආදිය පිළිබඳ මිනිස් ශ්‍රමය ගණනය කිරීමක් කළ යුතුය. එම ගණනය කිරීම පහත ආකාරයට සිදුවිය යුතුය.

| රැකියාව සඳහා යොදවන ස්ථානය | කම්කරු ගණන | වැටුප | | වැඩකරන පැය ගණන | අවශ්‍ය සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | දෛනික | මාසික | | |
| **රථගාල (දේශීය හා විදේශීය)** | 2 | 575 | 17250 | පැය. 8 | සාමාන්‍ය පෙළ විභාගයට පෙනීසිටීම |
| **ප්‍රවේශපත් කවුළුව** | 1 | 575 | 17250 | පැය. 8 | සාමාන්‍ය පෙළ විභාගය සමත් |
| **උරුම සැලස්ම්කරණය (සැලසුම් ශිල්පීන්)** | 1 | 950 | 28500 | පැය. 8 | සැලසුම්කරණය පිළිබඳව උපාධියක් හෝ ඩිප්ලෝමාවක් තිබීම |
| **සුදුසු ස්ථානයන්හි ආරක්ෂක භටයන් යෙදවීම** | 4 | 575 | 17250 | පැය. 8 | සාමාන්‍ය පෙළ විභාගයට පෙනීසිටීම |
| **සනීපාරක්ෂක සහ අනෙකුත් (පිරිසිදු කරන්නන්)** | 3 | 575 | 17250 | පැය. 8 | සුදුසු ශරීර යෝග්‍යතාවයකින් යුක්ත වීම |
| **සංවර්ධන කාර්යාලය (කාර්යාල සහායක)** | 2 | 600 | 18000 | පැය. 8 | උසස් පෙළ සමත් |
| **මාර්ගෝපදේශකවරු (දේශීය හා විදේශීය)** | 3 | 575 | 17250 | අවශ්‍ය පරිදි | උසස් පෙළ සමත් වීම හා භාෂා හැකියාව |

**පාහියන්ගල සංචාරක සංවර්ධනයට අවශ්‍ය මිනිස් ශ්‍රමය ගණනය කිරීම**

## නිගමනය

මේ අනුව පැහැදිලි වන්නේ පාහියන්ගල පුරාවිද්‍යා ස්ථානය, සංචාරක පුරවරයක් ලෙස දියුණු කිරීමට අවශ්‍ය මූලික පරිසරයක් ඇති බවයි. එම පරිසරය මනාව තේරුම් ගනිමින් උරුම කළමනාකරුවන් ස්ථානයේ වර්තමාන තත්ත්වය හොඳින් අවබෝධ කරගැනීම වැදගත් වේ. පවතින සම්පත් උපරිමයෙන් ප්‍රයෝජනයට ගනිමින් මනා සැලසුමකට අනුව ක්‍රියාකළ යුතුය. ස්ථානයේ සංචාරක ආකර්ෂණයට එය විශාල පිටිවහලක් වේ.

## ආශ්‍රිත මූලාශ්‍රය

දැරණියගල. එස්.යූ. (1991), *ශ්‍රී ලංකාවේ ප්‍රාග්-ඉතිහාසය,* පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ.

අරුක්ගොඩ, මු. (1961), *සත්ව වතගොත,* ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

විජයවර්ධන, කුසුම්සිරි (2008), *ශ්‍රී ලංකාවේ ලෙන්,* පහන් ප්‍රකාශන, බොරලැස්ගමුව.

උඩකන්දේ. ජී. (2012), *පාහියංගල සිතුවම් හා මූර්ති සංරක්ෂණ වාර්තාව*, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

පතිරණ යූ.පී.එස්. (2010), *සංචාරක ව්‍යාපාරයඃ පසුබිම, බලපෑම හා නව ප්‍රවණතා*, සරස්වතී ප්‍රකාශක, දිවුලපිටිය.

පතිරණ යූ.පී.එස්. (2001), *සංචාරක ව්‍යාපාරයඃ පරිසරය, සමාජය හා ආර්ථික ප්‍රවණතා*, සරස්වතී ප්‍රකාශක, දිවුලපිටිය.

ගුණවර්ධන, පී. (2008), *සංචාරක කර්මාන්තය*, සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා ඇල.

ගුණවර්ධන, පී. (2005), *පුරාවිද්‍යා උරුමය, ආකෘතිය, සංකල්ප හා කළමනාකරණය*, සමන්ති ප්‍රකාශකයෝ, ජා ඇල

*ජාතික සිතියම් සංග්‍රහය* (2011), රාජ්‍ය මිනින්දෝරු දෙපාර්තමේන්තුව, කොළඹ.

Oshan, W.M.C. (2011), *Stratigraphical Analysis of Fa-Hien Cave in Sri Lanka*: Comparing Stratigraphy Excavation 1988 and 2009, Deccan College Post- Graduate and Research Institute, Pune

https:// www.Archaeologia.com

https://www.google.com/search?q=www.sri+lanka+map

**සම්මුඛ සාකච්ඡා**

1. පූජ්‍ය යටගම්පිටියේ චන්දිම හිමි

   ස්ථානයඃ පාහියන්ගල පන්සල, දිනය. 2014. 09.95

2. ආචාර්ය නිමල් පෙරේරා මහතා (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ)

   ස්ථානයඃ කැලණිය විශ්වවිද්‍යාලය, දිනයඃ 2014. 10. 08